**ප්‍රසම්පාදන දැන්වීමයි**

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ලේ පිහිටි ආපනශාලාව**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙම විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ලේ ආපනශාලාව, බුලංකුලම දිසා මාවත, II පියවර, අනුරාධපුර පවත්වාගෙන යාම සඳහා සේවා සැපයුම්කරවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ඒ සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

01. අවම වශයෙන් ආපනශාලා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. මෙයින් වසර 01 ක කාලයක් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනයක ආපන ශාලාවක් සතුටුදායක අන්දමින් පවත්වා ගෙන යාම අනිවාර්යය වේ.

02. ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තු රු. 3000.00 ක් හා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ගාස්තුව රු. 5000.00 ඇතුළුව මුළු මුදල වශයෙන් රු. 8000.00 ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත ගෙවිය යුතුය. 2024.10.02 දින සිට සාමාන්‍ය කාර්යාල වේලාවන් තුලදී ''පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ මධ්‍යස්ථානයේ, බුලංකුලම දිසා මාවත, II පියවර, අනුරාධපුර යන ලිපිනයෙන් ලංසු ලිපිලේඛණ ලබාගත හැකිය. ලංසු බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ ''ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ලේ පිහිටි ආපනශාලාව'' යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කල යුතුය. පලපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය ලිපිලේඛණ හා ටෙන්ඩර් ඉල්ලුම්කරුගේ ඡායාරූපයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

මුද්‍ර තැබූ ලංසු නියෝජ්‍ය ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, බුලංකුලම දිසා මාවත, II පියවර, අනුරාධපුර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනැවිත් බහාලිය හැකිය.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ 2024.10.23 ප.ව. 2.15 ට ලංසු විවෘත කරනු ලබන අතර ලංසුකරුවන් හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් හට එම අවස්ථාවට සහභාගී වන ලෙසට ඉල්ලීමක් කරනු ලැබේ.

වැඩිදුර විස්තර ලබා ගැනීමට හෝ කරුණු පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වෙතොත් මෙම මධ්‍යස්ථානයේ නියේජ්‍ය ලේඛකාධිකාරිගේ පහත සඳහන් දුරකථන අංකයෙන් විස්තර ලබාගත හැකිය. දුරකථන අංකය 025- 2260120

මෙම කරුණු සම්බන්ධව විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ තිරණය අවසන් තීරණය වේ. මේ සඳහා අදාල වන විස්තර පත්‍රිකාව www.rjt.ac.lk වෙබ් අඩවියෙන් බාගත කල හැකිය.

ලේඛකාධිකාරී

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - මිහින්තලේ.

2024.10.02